

# ආදර්ශ ප්‍රශ්න පත්‍රය නර්තනය

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස් තැනට සුදුසු වචනය තෝරන්න.

1. පා සරඹ අභ්‍යාස කිරීමේදී යොදා ගන්නා ඝන වාද්‍ය භාණ්ඩය ............... නම් වේ.
   (1) ගැට බෙරය (2) පන්තේරුව (3) තාලම්පට (4) උඩැක්කිය

2. ‘‘රන් විළි දෙකොනට සොඳින් තබන්නේ’’ මෙම කවි පදය අයත් වන්නේ.........නැටුමටය.
   (1) ගොයම් (2) ලී කෙළි (3) කුලු (4) මෝල්ගස්

3. ලය ප්‍රභේද අනුව නර්තනයේදී ඉතා අඩු වේගය ..........ලෙස හැඳින්වේ.
   (1) විලම්භ (2) අති ද්‍රැත (3) මධ්‍ය (4) ද්‍රැත

4. දෙසුළු මහ තුන් තිතට අයත් තාල රූපය,මාත්‍රා............
   (1) 2+2+3 (2) 2+2+4 (3) 2+3+4 (4) 2+4+2

5.ග්‍රහ පන්ති හා ඇඹුම් කවි ............ශාන්ති කර්මයට අයත්ය.

(1) කොහොඹාකංකාරි (2) දෙවොල් මඩුව (3) සන්නි යකුම (4) බලි

6 . කඳවුරු සිරිත හා සද්ධර්ම රත්නාවලිය කෘති........යුගයේ නර්තන කලාව පිළිබඳ මූලාශ්‍ර වේ.

(1) මහනුවර (2) කෝට්ටේ (3) දඹදෙනි (4) ගම්පළ

7. පූර්ව රංගය හා අපර රංගය යනුවෙන් ........නාටකය කොටස් දෙකකට බෙදේ.

(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) නූර්ති

8. තාල තැබීමේදී තාලස්ථාන දැක්වීම ............නම් වේ.

(1) අනාඝාත (2) ආඝාත (3) ආතත (4) විතත

9. ලී දැතට ගෙන කණුවක් වටේ රටා මවමින් නටන ද්‍රවිඩ ගැමි නැටුම.......වේ.

(1) කෝලාට්ටම් (2) කාවඩි (3) පින්නල් කෝලාට්ටම් (4) කරගම්

10. බෙර පද කවි පද ආදියට අදාල තාල ලියා දැක්වීම.........යි.

(1) ප්‍රස්තාරකරණයයි (2) ප්‍රශ්නකරණයයි (3) ප්‍රකාශකරණයයි (4) වාර්තාකරණයයි

11 . පිළිවෙලින් ඉලංගම් සරඹ හා ගොඩ සරඹ අවසානයේ නටනුයේ ............

(1) කස්තිරම හා සීරුමාරුවයි (2) ඉරට්ටිය හා අඩව්වයි

(2) කස්තිරම හා ඉරට්ටයයි (4) ඉරට්ටිය හා කස්තිරම

12. පිළිවෙලින් සබරගමු නර්තන හා උඩරට නර්තන සම්ප්‍රදායට අයත් නාට්‍යමය පෙළපාලි වන්නේ,

(1) ගුරුගේ මාලාව හා අසුර යක්කම (2) අඹ විදමන හා අසුර යක්කම

(3) වැදි යක්කම හා ගුරුගේ මාලාව (4) අසුර යක්කම හා ගුරුගේ මාලාව

13. ‘‘ශෝක’’ නම් ස්ථායි භාවයෙන් උපදින රසය වන්නේ,

(1) ශෘංගාර රසය (2) කරුණා රසය (3) වීර රසය (4) හාස්‍ය රසය

14. ආඝාතාත්මක හා අනාඝාතාත්මක යන ලක්ෂණ දෙකම එකවර යෙදෙන ගායන විශේෂය,

(1) කරත්ත කවි වේ (2) ටීකා කවි වේ (3) හටන් කවි වේ (4) පාරු කවි වේ

15.හණ නූලෙන් සකසා පවන් සැලීමට යොදා ගත් රාජ සභා මෙවලමකි.

(1) අවාන (2) සේසත (3) චාමර (4) සේලය

16. ‘‘බඹවිමනෙව් දිසි දළදා මැදුරක ‘‘ .......මෙම ගායනය

(1) හටන් කවියකි (2) ශ්ලෝකයකි (3) නමස්කාරයකි (4) ටීකාවකි

17. රජු ඉදිරියේ දෙව් මිනිස් නැටුම් කරවූ බවට ඓතිහාසික තොරතුරු හමුවන්නේ

(1) අනුරාධපුර යුගයේදීය (2) කෝට්ටේ යුගයේදීය

(3) පොළොන්නරු යුගයේදිය (4) දඹදෙනි යුගයේදිය

18. කොහොඹා කංකාරියට සහභාගීවන ප්‍රධාන ඇදුරන් හඳුන්වන්නේ,

(1) ආතුරයන් නමිනි (2) යක්දෙස්සන් නමිනි

(3) අතෝරකරුවන් නමිනි (4) කොට්ටෝරුවන් නමිනි

19. නර්තනයේ අවකාශය හා රිද්මය මෙන් චිත්‍ර කලාවේ දී අවශ්‍ය වන්නේ,

(1) වර්ණය හා හැඩතලය (2) වර්ණ හා දිශාවය

(3) දිශාව හා හැඩතලය (4) රේඛාව හා දිශාව

20. A B





පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත දැක්වෙන රූප පෙළෙහි A හා B රූප අයත් වන්නේ කුමන වර්ගයකටද?

(1) ආතත හා විතත (2) විතත හා ආතත (3) විතත හා ඝන (4) ඝන හා ආතත

21.මාත්‍රා 2+3 තිත් රූපයට අයත් බෙර පදයකි

(1)දොං දොං ජිං ජිං ගජිගත (2) දොං ජිංත ගත දොංත

(3)දොං ජිජි ගත (4) දොං ජිං ජිං ජිකු තක

22. "තෙයි ති තා තෙයි" යනු

(1) පළමුවන පා සරඹයයි (2) හයවන පා සරඹයයි (3) පස්වන පා සරඹයයි (4) දෙවන පා සරඹයයි

23. සිංහරාජ වන්නම අයත් තිත් රූපය වන්නේ,

(1) මාත්‍රා 2+3 වය (2) මාත්‍රා 3+4 වය (3) මාත්‍රා 2+4 වය (4) මාත්‍රා 4+4 වය

24. ගැටබෙර කදෙහි දිග ප්‍රමාණය වන්නේ,

(1) තුන් වියත් තුනගුලකි (2) තුන් වියතකි (3) තුන් වියත් දැඟුලකි (4) එක් වියත් තුනඟුලකි

25. හත් පදයට අයත් නර්තනාංගයකි

(1) දළුමුර පදය (2) තැඹිලි පදය (3) කොතල පදය (4) හමාර පදය

26 කොහොඹාකංකාරියේ එන ගායනය සහිත නර්තන අංගයකි.

(1) යක් ඇනුම (2) හත්පදය (3) යක්තුන් පදය (4) මඩුපුරය

27 කොහොඹා කංකාරියට පමණක් අයත්වන චාරිත්‍ර විධියකි.

(1) කප් සිටුවීම (2) මිල්ල කැපීම (3) හඟලේ යැදීම (4) මඩුපේ කිරීම

28. උඩරට නර්තනයට ආවේණික වූ රංග වස්ත්‍රාභරණයකි.

(1) කාඟුල් (2) අවුල් හැරය (3) නළල් පට (4) රහු

29. උඩරට වන්නම් දහ අටට අයත් වන්නමකි.

(1) අනිලා වන්නම (2) ගජබා වන්නම (3) සිංහනාඩි වන්නම (4) සිංහරාජ වන්නම

30. පහත සඳහන් රූපයේ දැක්වෙන්නේ

(1) නාග රාක්ෂ මුහුණයි
(2)ගුරුළු රාක්ෂමුහුණයි
(3)නාග කන්‍යා මුහුණයි
(4)ගරා වෙස් මුහුණයි



- ප්‍රශ්න අංක 31 සිට 32 ට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් වගුව උපයෝගී කර ගන්න.

| පේළි | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව | 4 තීරුව |
|---|---|---|---|---|
| A | පුංග් | වෙන්ඩා | තබ්ලාව | මෘදංගය |
| B | ධෘපට්ටා | උච්චිපට්ටම් | කිරීටම් | පොෂ්වාන් |
| C | පදම් | පරන් | රාස්ලීලා | තෝඩායම් |

31.පිළිවෙලින් භරත, කථක් ,කථකලි, මණිපුරි නර්තන සම්ප්‍රදායන්ට අයත් වාද්‍ය භාණ්ඩ සඳහන් වන්නේ.

(1) A පේළියේ 1,2,3,4 තීරුවලය (2) පේළියේ 2,3,4,1 තීරුවලය
(3) A පේළියේ 4,3,2,1 තීරුවලය (4) A පේළියේ 3,2,4,1 තීරුවලය

32. කථක් සහ මණිපුරි නර්තන සම්ප්‍රදායට අයත් අංග සඳහන් වන්නේ,

(1) C පේළියේ 1,2 තීරුවලය (2) C පේළියේ 2,3 තීරුවලය

(3) B පේළියේ 1,3 තීරුවලය (4) A පේළියේ 3,4 තීරුවලය

33.එස් පණීභාරත මහතා සහ ඒ ඉඹුල්ගොඩ මහතා විසින් නිර්මාණය කරණ කල මුද්‍රා නාට්‍ය ලෙස සැලකෙන්නේ,

(1) තිත්ත බත හා රන්දදය (2) කරදිය හා රන්දදය

(3) තිත්තබත හා කරදිය (4) නලදමයන්ති හා ග්‍රහ අපලය

34.උ;ඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වන්නේ,

(1) තනි කච්චියයි (2) වෙස් ඇඳුම් කට්ටලයයි

(3) නෛයඩි ඇඳුම් කට්ටලයයි (4) බෙර ඇඳුම් කට්ටලය

35. මෙම කස්තිරම සම්පූර්ණ කිරීමට පහත සඳහන් වරණ අතුරින් ගැළපෙන පදය තෝරන්න.

ගත්තකු ජිත්තම් ගජිතකු .............තරිකිට ජිත් ...............තා

(1) කුංදත්,තරිකිට කුංදත් (2) ජිතතම් , තරිකිට දොම්කිට

(3) ජිත්තම්, කඩතක තරිකිට (4) කුන්දත් ,තරිකිට දොම්කිට

36. මහනුවර දළදා පෙරහැරේ නර්තනය පැවති අයුරු සඳහන් කලේ,

(1) ඉබන් බතුතා (2) පාහියන් භික්ෂුව (3) රොබට් නොක්ස් (4)ක්වේරෝස් පියතුමා

37.සොකරි හා කෝලම් හැඳින්වෙන්නේ,

(1) නාඩගම් ශෛලියක් ලෙසටය (2) වීදි නාට්‍ය ශෛලියක් ලෙසටය

(3) ශෛලීගත සම්ප්‍රදායක් ලෙසටය (4) ගැමි නාටක සම්ප්‍රදායක් ලෙසටය

38. රස නිෂ්පත්තිය සඳහා මූලික වන භාව හඳුන්වන්නේ

(1) ස්ථායි භාව යනුවෙනි (2) සංචාරී භාව යනුවෙනි (3) අනුභාව යනුවෙනි (4) විභාව යනුවෙනි.

39.මණ්ඩිය පවත්වා ගැනීමේදි පාද අතර තිබිය යුතු දුර ප්‍රමාණය වන්නේ.

(1) මිටි රියනකි (2) තුන් වියත් තුනගුලකි (3) දසඟුලකි (40 විග්ගුස්සකි

40. මුල් යුගයේ වන්නම් රචනා කළා යැයි සැලකෙන්නේ,

(1) රාජ සභාවේ රඟ දැක්වීමට (2) කවිකාර මඩුවේ ගායනය සඳහා

(3) දළදා පෙරහැරෙහි නැටීම සඳහා (4) සමාජ උත්සව වලදී රඟ දැක්වීමට